# ඉසුරුමුණිය ආශ්‍රිතව හමුවන්නා වූ කැටයම් වල ගැටෙන්නා වූ ලෝකෝත්තර හා ලෞකික හැඟීම් පිළිබඳ අධ්‍යයනයක්

**ඉෂාරා පී.ඩී,[1] කීර්තිරත්න එන්.පී.එස්.ඩබ්,[2] විජේසේකර ඩී.ටී.[3]**

ඉසුරුමුණිය දේවානම්පියතිස්ස සමයට දිවයන අතීතයක් හිමි ආරාමයකි. සමකාලීනව බුදුදහම ප්‍රචලිත වීමට විවිධ ක්‍රමයන් මෙකල පාලකයන් ඉටු කළහ. ඉසුරුමුණිය තුළ දක්නට ඇති කැටයම් අතර ලෝකෝත්තරයට වඩා ලෞකිකත්වයට බර කැටයම් දක්නට ලැබේ. ඉසුරුමුණිය ආශ්‍රිතව හමුවන කැටයම් වලින් ලෝකෝත්තර හැඟීම් උද්දීපනය කෙරේ ද නොඑසේ නම් ලෞකික හැඟීම් උද්දීපනය කෙරේද යන්න මෙම පර්යේෂණය තුළින් සිදු කෙරේ. ලංකාව තුළ පවතින ආරාමික බෞද්ධ සංකල්පය තුළ ආරාමයක් වන ඉසුරුමුණියෙහි කැටයම් ලෞකිකත්වය විදහාපානු ලබන්නේ ඇයි දැයි යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. ලංකාවේ ආරාමික කැටයම් කලාවට ලෞකිකත්වය හා ලෝකෝත්තර හැඟීම් ඈඳා ගැනීම තුළින් බෞද්ධ ගිහි සබඳතාවය ඒක ගැනීමට ගත් උත්සාහය හඳුනාගැනීම මෙහි පර්යේෂණ අරමුණ වේ. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යනය හා ඉසුරුමුණි විහාරාශ්‍රිත කැටයම් අධ්‍යනය කරමින් නිගමනයන්ට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. ඉසුරුමුණි පෙම් යුවල මගින් ශෘංගාරය ද, රජ පවුල කැටයමින් ගෘහස්ථ ජීවිතය ද, කිඳුරු කැටයමින් බැඳීම හා වින්දනය ද, ඇත් කැටයමින් සැපය හා සුවයද, මිනිසා හා අශ්ව හිස කැටයමින් මනුෂ්‍යයා හා සත්ත්ව ගෘහ බැඳීම ද උද්දීපනය කරනු ලබයි. ලෝකෝත්තර අදහස් උද්දීපනය කරනු ලැබිය යුතු ආරාමයක ලෞකිකත්වයට නැඹුරු අදහස් උද්දීපනය කරනුයේ මන්දැයි සොයා විමර්ශනයේදී හමු වූ දත්ත වලට අනුව පෙනී යනුයේ, මෙය බුදුදහම තුළට ගිහියන් කාවද්දා ගැනීම උදෙසා ආරාමික භික්ෂූන් වහන්සේලා හා පාලකවරුන් ගෙනගියා වූ සියුම් උපක්‍රමයක් බවයි. බුදුදහම ලෞකිකත්වය ප්‍රතික්ෂේප නොකරන අතර මෙහිදී කැටයම් මගින් ලෞකිකත්වය උද්දීපනය කොට යටි අරුතින් ලෞකිකත්වයේ පිරිහීමත්, ලෝකෝත්තරත්වයේ පිබිදීමත් අදහස් කොට දක්වයි. ඒ අනුව ඉසුරුමුණියේ පෙම් යුවල කැටයමින් වියපත් වැඩිහිටියන්ට හිරි ඔත්තප්පය ද, රජ පවුල කැටයමින් අස්ථිර වූ බැඳීම් ද, කිඳුරු කැටයමින් අස්ථිර වූ වින්දනය ද හා දුක ද, ඇත් කැටයමින් දුක්ඛ භාවය හා බුදුන් පිළිබඳව ද, මිනිසා හා අශ්ව හිස කැටයමින් මනුෂ්‍ය හා තිරිසන් ලොව ද අර්ථ දක්වනු ලබයි. මින් විහාරාරාමයට පැමිණෙන ජනයා යථාර්ථවාදීව ලෝකෝත්තර ඥාණය පහදා ගනු ලබන අතර බුදුදහමට එක්කර ගනු ලැබීම උදෙසා සියුම් කැටයම් තුළින් චිත්තාකර්ෂණීය වූ ලෞකික හැඟීම් ද දනවනු ලබයි. මේ අනුව ඉසුරුමුණි කැටයම්හි භාව ලක්ෂණයෝ ද ගත් කළ බොහෝ සෙයින් ලෞකිකත්වයට බරව කැටයම් කොට ඇත්තේ ලෞකික හැඟීම් උද්දීපනයෙන් ලෝකෝත්තර බව සලසා ගැනීමට හා ආගමික සංකල්පයන්ට ජනතාව නැඹුරු කර ගැනීම උදෙසා බව මේ ආකාරයෙන් නිගමනය කළ හැකි වේ.

**ප්‍රමුඛ පද :** ලෞකික, ලෝකෝත්තර, යථාර්ථවාදී, කැටයම්, ඉසුරුමුණිය

[1,2,3] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය. isharadushlani1996@gmail.com